# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2208/18 - 2020 දෙසැම්බර් මස 30 වැනි බදාදා - 2020.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

තුන්වැනි සංශෝධනය

2018 ජුනි මස 19 දිනැති, අංක 2076/14, 2017 පෙබරවාරි 02 දිනැති, අංක 2004/59 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත 2014 ඔක්තෝබර් මස 22 දිනැති හා අංක 1885/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 දෙසැම්බර් මස 21 වැනි දින,

| *අනු. අංකය* | *ඡේද අංකය* | *යෝජිත සංශෝධනය* |
|---|---|---|
| 1. | 7.2.2.4 | (iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය |
| 2. | 10.1.1 | (vii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය |
| 3. | 10.2.1 | (iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය<br>අනු අංක (v) හා (vi) යටතේ ඇතුළත් සුදුසුකම් වෙනුවට පහත සඳහන් සුදුසුකම ඇතුළත් කරනු ලැබේ.<br>(v) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට අවම වශයෙන් පහත සඳහන් එක් සුදුසුකමක් හෝ සම්පූර්ණ කර තිබීම.<br>*(අ)* අධ්‍යාපනවේදී උපාධිය<br>*(ආ)* පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව<br>*(ඇ)* පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව<br>*(ඈ)* පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව |

01 - 88

1A - G 33387 — 25 (2020/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*